- දැන්වීමයි -

# දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## දකුණු පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත / සීමිත තරග විභාගය - 2019

## Open/Limited Competitive Examination for Recruitment to the Posts of Management Assistants Class III in Southern Province-2019

**** විශේෂයෙන් සැළකිය යුතුයි ****

**මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ දී දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.psc.sp.gov.lk) හරහා අනිවාර්යෙන්ම ලියාපදිංචි වී අයදුම්කල යුතුය.**

1.0 අංක 192 හා 2014.09.11 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද හා 2017.11.28 හා 2018.11.02 දිනැතිව සංශෝධිත දකුණු පළාත් කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බහුකාර්ය බණ්ඩ 1 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධානයන්ට අනුව දකුණු පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත / සීමිත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් දකුණු පළාතේ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. **2019.01.31 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව 150කි.** අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය **2019.03.08** දින වන අතර මෙම විභාගය **2019 ජුනි මස** පවත්වනු ලබයි.

2.0 දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සපුරා ඇති විවෘත අයදුම්කරුවන් දිස්ත්‍රික් අනුපාතය අනුව බඳවා ගැනීම සිදු කෙරේ. පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70% ක් විවෘත තරඟ විභාගයෙන් හා 30% ක් සීමිත තරඟ විභාගයෙන් බඳවා ගන්නා අතර සීමිත අයදුම්කරුවන් 30% ක් නොමැති වූ විට එම පුරප්පාඩු ප්‍රමාණය විවෘත අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ. බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

3.0 වැටුප : අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, දකුණු පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට අදාල වැටුප් කාණ්ඩය MN-02-2016 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 28,940 – 10x300 - 11x350 - 10x560- 10x660 - 47,990 වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව 2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා අදාළ වනුයේ රු.25,950 ක මූලික වැටුපක් හා රු.889/-ක ගැලපුම් දීමනාවකි.

4.0 මෙම තනතුර ස්ථිර තනතුරකි. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතු වේ.

5.0 සුදුසුකම් :- දකුණු පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම සම්පූර්ණ කල යුතු වේ.

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. සෑම අපේක්ෂකයකුම දකුණු පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට **"අයදුම් කරනු ලබන දිස්ත්‍රික්කය තුළ පූර්වාසන්නයේ වසර 05 ක කාලය තුළ අනුගාමී වසර 03 ක අයදුම්කරුගේ ස්ථිර පදිංචිය හෝ පූර්වාසන්නයේ වසර 05 ක කාලය තුළ අනුගාමී වසර 03 ක කලත්‍රයාගේ ස්ථිර පදිංචිය සමඟ අයදුම්කරුගේ එක් වසරක ස්ථිර පදිංචිය"** සනාථ කළ යුතුය. පදිංචිය සනාථ කළ යුත්තේ සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කිරීම මඟින් විය යුතු ය.

(අ). මැතිවරණ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඡන්දහිමි නාම ලේඛන උද්ධෘතය හා

(ආ). ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන පදිංචි සහතිකය.

IV. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට හෝ ප්‍රථම පහත සඳහන් **සියලු සුදුසුකම්** සපුරා තිබිය යුතුය.

විවෘත අයදුම්කරුවන්

- **අධ්‍යාපන සුදුසුකම් :**

  - සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුලුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

  සහ

  - අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

- **වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

සීමිත අයදුම්කරුවන්

- **අධ්‍යාපන සුදුසුකම් :** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය / අංක ගණිතය / ශුද්ධ ගණිතය / මූලික ගණිතය / වාණිජ අංක ගණිතය ඇතුලුව විෂයයන් හයකින් (06) සමත් ව තිබීම.

- **පළපුරුද්ද :** නියමිත දිනට දකුණු පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර, ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කොට තිබිය යුතුය. ( යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තාවූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තාවූ හෝ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් ඉහත සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාලසීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික / අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාලසීමාව සඳහා ගණන් ගනු නොලැබේ.)

- **වෙනත් :** දකුණු පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් දරණ එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව ප්‍රාථමික මට්ටමේ **PL** කාණ්ඩයේ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සහ **MN**-01 2006 **A** වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් විය යුතුය.

## 6.0 විභාග පරිපාටිය :-

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර, ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| විභාගය | විෂයය | ලකුණු | කාලය |
|---|---|---|---|
| විවෘත හා සීමිත | අභියෝග්‍යතාවය | 100 යි | පැය 01 යි |
| විවෘත | භාෂා හැකියාව | 100 යි | පැය 02 1/2 යි |
| සීමිත | භාෂා හැකියාව හා කළමනාකරණ සහකාර සේවා යෝග්‍යතා පරීක්ෂණය | 100 යි | පැය 02 1/2 යි |

ඉහත විෂයයන්ට අදාළ විෂයය නිර්දේශ පහත පරිදි වේ.

- **<u>අභියෝග්‍යතාවය</u> -** මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්න වලින් සමන්විත වේ.

- **<u>භාෂා හැකියාව</u> -** මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්තාර වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්න වලින් සමන්විත වේ.

- **<u>භාෂා හැකියාව හා කළමනාකරණ සහකාර සේවා යෝග්‍යතා පරීක්ෂණය</u> -** මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය භාෂාව හා රචනය, දෙන ලද තොරතුරු අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්තාර වගු සකස් කිරීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් ද කාර්යාලයක ලියවිලි සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය පිළිබඳ මූලික නීති රීති සහ කළමනාකරණ සහකාර නිලධරයෙකු විසින් කටයුතු කළ යුතු කරුණු අඩංගු ලිපියක් පිළිබඳ ක්‍රියා කරන ආකාරය ආදී කළමනාකරණ සහකාර නිලධරයෙකුගේ රාජකාරී පිළිබඳ අපේක්ෂක / අපේක්ෂිකාවන් සතු දැනුම පරීක්ෂා කරන ප්‍රශ්න පත්‍රවලින් ද කාර්යාලයක ප්‍රයෝජනයට ගනු ලබන ඇමතුම් දින පොත, වවුචර්, චලන පත්‍රිකා, පැමිණීමේ ලේඛනය, දින මුද්‍රාව, මුද්‍රාව හා නාම මුද්‍රාව, තැපැල් මල්ල ආදී උපකරණ ගැනත් ඒවායින් ඇති ප්‍රයෝජන ගැනත් අපේක්ෂක / අපේක්ෂිකාවන් සතු දැනුම පරීක්ෂා කරන ප්‍රශ්නවලින් ද මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ.

  (අපේක්ෂකයන්ගේ රාජකාරි කටයුතු සඳහා සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.)

  පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙන් 40% ක් බැගින් වත් අපේක්ෂකයින් විසින් ලකුණු ලබා ගත යුතුය. සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් ම නොපැහැදිලි අත්අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% ක් වත් ලකුණු ලබාගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබා ගත් ලකුණු අනුපිළිවෙළ තරයේ ම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

  ලිඛිත විභාගයේ ප්‍රතිඵල සියලුම අයදුම්කරුවන් වෙත මෙම කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා නිකුත් කරනු ඇත.

**7.0** **විභාග ගාස්තු:-** විභාග ගාස්තුව රු. 400/- කි. මෙම මුදල **දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13** ට බැරවන ලෙස දකුණු පළාත තුළ පිහිටි **ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට** ගෙවා අයදුම්කරුගේ නමින් වූ ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇලවිය යුතු ය. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, **විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, තැපැල් හෝ උප තැපැල් කාර්යාලවලට ගෙවන ලද මුදල් ද භාරගනු නොලැබේ.**

## 8.0 විභාගය පැවැත්වීමට යෝජිත නගර

විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට යෝජිත නගරයන් පහත පරිදිය. යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වූ විට විභාගය ආසන්නතම නගරයේදී පවත්වනු ඇත. අයදුම්කරුවන් නගරය ලෙස සඳහන් කළ යුත්තේ අයදුම්කරු ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයේ පහත සඳහන් නගරයක් පමණි.

| | ගාල්ල දිස්ත්‍රික්කය | මාතර දිස්ත්‍රික්කය | හම්බන්තොට දිස්ත්‍රික්කය |
|---|---|---|---|
| නගර | ගාල්ල | මාතර | තංගල්ල |
| | අම්බලන්ගොඩ | අකුරැස්ස | හම්බන්තොට |
| | බද්දේගම | | |

## 9.0 අයදුම්පත්‍ර

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.psc.sp.gov.lk) හරහා අන්තර්ජාලය හරහා අනිවාර්යයෙන්ම විභාගය සඳහා ලියාපදිංචි විය යුතු අතර, ඒ 4 (සෙ.මී.21x29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින් අයදුම්පත්‍රයෙහි දෘඪ පිටපතක් (Hard Copy) **2019 මාර්තු මස 08 දින** හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එම දෘඪ පිටපත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"දකුණු පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත / සීමිත තරග විභාගය - 2019"** යන්න සඳහන් කරන්න.

ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
6වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,
ගාල්ල.

9.1 **අන්තර්ජාලය හරහා විභාගය සඳහා ලියාපදිංචි විමේදී සෑම අයදුම්කරුවෙකු සතුව වලංගු ජාතික හැඳුනුම්පතක්, ඔබගේ හෝ ඔබට තොරතුරු සැපයීමට හැකි ළඟම පුරවැසියෙකුගේ සක්‍රිය ජංගම දුරකතන අංකයක් හා විභාග ගාස්තු ගෙවූ රිසිට් පතද තිබීම අත්‍යවශ්‍ය වේ.** විභාගය පිළිබඳ සියලුම තොරතුරු පසුව දැනුම් දෙනු ලබන්නේ ඔබ විසින් සපයන ලද ජංගම දුරකතන අංකය හරහා වේ. විභාගය සඳහා ලියාපදිංචි වීමෙන් අනතුරුව ලැබෙන නියමිත අයදුම්පත්‍රයට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් අනිවාර්යයෙන්ම ළඟ තබා ගත යුතුවේ. විභාගය සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය සියලු උපදෙස් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය ( www.psc.sp.gov.lk) මඟින් ලබා ගත හැකි අතර එහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගෙන එහි සඳහන් නීති රීති මැනවින් අනුගමනය කිරීම ඔබ සතු වගකීමකි.

9.2 නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ සෑම අතින් ම සම්පූර්ණ අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිල වෙබ් අඩවිය හරහා ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

9.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියකු, වාර්ෂික වැටුප රු. 240,360/- ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරණ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

10.0 අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. තවද, අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i.) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii.) වලංගු රියදුරු බලපත්‍රය

අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.sp.gov.lk හරහා නිකුත් කළ වහාම ඒ බව ඔබ විසින් දෙනු ලබන ජංගම දුරකතන අංකයට කෙටි පණිවිඩයක් මඟින් දැනුම් දෙනු ලබන අතර ඔබ විසින් එම ප්‍රවේශ පත්‍රයේ දෘඪ පිටපතක් (Hard Copy) ලබා ගත යුතුය. විභාගය පැවැත්වීමට නියමිත දිනට දින **07** කට කලින් විභාග ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට නොහැකි වූ අපේක්ෂකයින් පහත සඳහන් විස්තර ඇතිව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දුරකථන අංක **091-2234309 / 0912248450** ඔස්සේ දැන්විය යුතුය.

I. විභාගයේ නම
II. අයදුම්කරුගේ සම්පූර්ණ නම
III. සම්පූර්ණ ලිපිනය
IV. ඉල්ලුම් පත් තැපැල් කළ කාර්යාලය හා ලියාපදිංචි කළ අංකය හා දිනය
V. විභාගය සඳහා ලියාපදිංචි වූ දිනය

11.0 **තෝරා ගැනීමේ ක්‍රමය**

මෙම තනතුරු සඳහා ඉහත දක්වා ඇති පරීක්ෂණවලින් දක්වන ලද කුසලතාවය හා රා.ප.ච.15/90 හි සඳහන් විධිවිධාන හා දිස්ත්‍රික් ජනගහන අනුපාතයට අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයකින් පසුව සුදුස්සන් තෝරා ගනු ලැබේ. (පත්වීම් ප්‍රදානයේදී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්වීම් දිය යුතු අවසාන ප්‍රමුඛතා මට්ටමේ සම ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිපදෙනෙකු සිටින අවස්ථාවකදී සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අධ්‍යාපන සුදුසුකම් අනුව ඉහලම සුදුසුකම් ඇති පුද්ගලයන් අනුපිළිවෙලින් තෝරා ගැනේ.) යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු ඇබෑර්තු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

11.1 රා.ප.ච.15/90 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3%ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේදී සුදුසුකම් ලබන ආබාධ සහිත පුද්ගලයන් අතුරින් ඉහළ ම ලකුණු ලබාගත් 3%ක ප්‍රතිශතයක් පමණක් පත්වීම් ලබා දීම සඳහා තෝරා ගැනෙනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයන්ගේ ලකුණු මට්ටම යටත් පිරිසෙයින් 50%ක් වත් විය යුතු ය. පත්වීමක් සඳහා තෝරා ගනු ලැබූ අපේක්ෂකයකු විශේෂඥ වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන අතර, විශේෂඥ වෛද්‍ය වාර්තාවකින් තම ආබාධ සහිත තත්ත්වය හා එය අදාල තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා බාධාවක් නොවන බව තහවුරු කළ යුතු ය. මේ අනුව, ඔබගේ ආබාධිත තත්ත්වය සනාථ කළ හැකි ලිපි අයදුම්පත්‍රයට ඇමිණිය යුතු ය.

11.2 සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව සෑම අයදුම්කරුවෙකුටම විභාගයට ඉදිරිපත්වීම සඳහා අවස්ථාව ලබාදෙනු ලැබේ. විභාග ප්‍රතිඵල මත කුසලතාවය අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, අයදුම්පත් කැඳවන අවසාන දිනට, නිවේදනය ප්‍රකාර සුදුසුකම් ලබා නොමැති අයදුම්කරුවන් පත්වීමක් ලැබීමට සුදුසුකම් නොලබන්නේය.

12.0 **සාවද්‍ය තොරතුරු සැපයීම**

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද, අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

13.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

14.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වේතොත් ඒ සම්බන්ධව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

**යූ.ජී.විදුර කාරියවසම්**<br>
ලේකම්<br>
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2019 පෙබරවාරි මස 01 දින,<br>
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,<br>
6 වන මහල,<br>
දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,<br>
ගාල්ල.

(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස් කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි කිසිදු වගකීමක් දරනු නොලැබේ.)